M 924

# පන්තිකාමර මට්ටමේ තක්සේරුකරණයේ දී ලබා ගන්නා තොරතුරු, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සංවර්ධනය සඳහා යොදා ගන්නා ආකාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**එම්. ඒ. ඉන්ද්‍රා පත්මිණී පෙරේරා**

විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂ) උපාධිය (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (කොළඹ විශ්වවිද්‍යාලය)

අධ්‍යාපනපති උපාධිය (කොළඹ විශ්වවිද්‍යාලය)

UCLIB
588051

කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධය

2016

# සාරාංශය

ඉගෙනුම හා ඉගැන්වීම යනු සෑම විට ම අන්‍යෝන්‍ය ලෙස බැඳී පවතින කාර්යයන් දෙකකි. ගුරුවරු ඔවුන්ගේ ඉගැන්වීම් කාර්යයයේ දී සෑම විට ම ශිෂ්‍යයින්ගේ ඉගෙනුම පිළිබඳ ව සහ එම ඉගෙනුම හා සම්බන්ධ ගැටලු පිළිබඳ ව දැන සිටීම අවශ්‍ය වේ. එ මගින් ශිෂ්‍යයින්ගේ අවශ්‍යතාවලට ගැලපෙන සේ ගුරුවරුන්ට පාඩම් සැලසුම් කළ හැකි ය. නමුත් ශිෂ්‍යයින්ගේ අවශ්‍යතා පෙර කීම කළ නොහැකි ය. එසේ ම ශිෂ්‍යයින්ගේ අවශ්‍යතා ශිෂ්‍යයාගෙන් ශිෂ්‍යයාට වෙනස් වේ. නිරීක්ෂණය කිරීම මගින්, සාකච්ඡා කිරීම මගින්, ලිඛිත වැඩ කියවීම මගින් ආදී විවිධ ක්‍රම භාවිතයෙන් ශිෂ්‍යයින්ට අවශ්‍ය දේ ගුරුවරු හඳුනාගත යුතු ය. තක්සේරුකරණය යනු ගුරුවරයා හා ශිෂ්‍යයා නියුක්ත වන ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාකාරකම් වඩාත් යහපත් කිරීමට අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දීම සඳහා තොරතුරු සපයන, ගුරුවරයා හා ශිෂ්‍යයා විසින් යොදා ගනු ලබන සියලු ම ක්‍රියාකාරකම් අදහස් වන බව බ්ලැක් සහ විලියම් (1998) සඳහන් කර ඇත.

ඒ අනුව, පන්තිකාමර මට්ටමේ තක්සේරුකරණයේ දී ලබා ගන්නා තොරතුරු ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ සංවර්ධනය සඳහා යොදා ගන්නා ආකාරය පිළිබඳ ව විමර්ශනය කිරීමට මෙම අධ්‍යයනය ක්‍රියාත්මක කෙරිණි. මෙම අධ්‍යයනය පන්තිකාමර මට්ටමේ තක්සේරුකරණය සඳහා අවශ්‍ය වන, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආශ්‍රිත තොරතුරු රැස්කිරීමට ගුරුවරු යොදා ගන්නා ශිල්ප ක්‍රම අධ්‍යයනය කිරීම, භාවිත කළ විවිධ ශිල්ප ක්‍රම මගින් ගුරුවරු රැස්කරන තොරතුරු අධ්‍යයනය කිරීම, පන්තිකාමර මට්ටමේ තක්සේරුකරණ ප්‍රතිඵල ශිෂ්‍යයාගේ ඉගෙනුම් ක්‍රියාවලිය සංවර්ධනය සඳහා භාවිත කෙරෙන ආකාරය විමසා බැලීම සහ පන්තිකාමර මට්ටමේ තක්සේරුකරණ ප්‍රතිඵල ගුරුවරයාගේ ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය සඳහා භාවිත කෙරෙන ආකාරය විමසා බැලීම යන සුවිශේෂී අරමුණු හතර ඔස්සේ විමසුමට ලක් කෙරේ.

මෙහි පළමුවන පරිච්ඡේදයෙන් පර්යේෂණ ගැටලුව හා ගැටලුවේ පසුබිම පුළුල් ලෙස විමසුමට ලක් කර ඇත. පන්තිකාමර තක්සේරුකරණයේ (සම්භවන තක්සේරුකරණයේ) පසුබිම පිළිබඳ ව හා නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සිදු වූ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සමඟ තක්සේරුකරණයේ හා ඇගැයීම් ක්‍රමයේ සිදු වූ වෙනස්කම් පිළිබඳ ව ද මෙහි දී ගැඹුරින් විමසා බලා ඇත. ඒ සෑම ප්‍රතිසංස්කරණයක දී ම තක්සේරුකරණය සඳහා වැඩි අවධානයක් යොමු වී ඇත.

දෙවන පරිච්ඡේදයෙන් පර්යේෂණ ගැටලුවට අදාළ සාහිත්‍යය, ගැටලුවට අදාළ න්‍යායාත්මක කරුණු ද පෙර පර්යේෂණ අනාවරණ ද පදනම් කරගෙන විමසා ඇත. එම තොරතුරු මිනුම, තක්සේරුව හා ඇගැයීම යන සංකල්ප නිර්වචනය, පන්තිකාමර තක්සේරුකරණ ක්‍රියාවලිය, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය, පන්තිකාමර තක්සේරුකරණ ශිල්ප ක්‍රම, තක්සේරුකරණ ප්‍රතිඵල භාවිතය සහ පන්තිකාමර තක්සේරුකරණය පිළිබඳ පර්යේෂණ අනාවරණ යන තේමා ඔස්සේ විස්තරාත්මක ව ඉදිරිපත් කර ඇත. පන්තිකාමරය තුළ ප්‍රායෝගික ව යොදා ගත හැකි, එක් එක් ශිෂ්‍යයාගේ ඉගෙනුම් අවශ්‍යතා පහසුවෙන් හඳුනාගත හැකි තක්සේරුකරණ ශිල්ප ක්‍රම පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක් හා පන්තිකාමරය තුළ කෙරෙන තක්සේරුකරණයෙන් ඉහළ හා පහළ සාධනයක් පෙන්නුම් කරන ශිෂ්‍යයින්ගේ සාධනය අතර පරතරය අඩු කළ හැකි බව ද තහවුරු වේ. මෙ ලෙස පන්තිකාමර තක්සේරුකරණය මගින් පන්තිකාමරයේ සිටින සිසුන්ගේ සාධන

මට්ටම් අතර පරතරය (Gap) අඩු කළ හැකි බවත් සිසුන් සක්‍රීය ඉගෙනුමකට දායක කර ගැනීමට හැකි වන බවත් එ මඟින් ගුරුවරයාගේ ඉගැන්වීම ද වඩාත් සාර්ථක කර ගැනීමට හැකි බව බවත් පැහැදිලි කර ඇත.

තුන්වන පරිච්ඡේදයෙන් විස්තරාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ ඇති සමීක්ෂණ ක්‍රමය භාවිත කරමින්, අධ්‍යයනයේ ජනගහනය, ඉලක්ක ජනගහනය හා ලඟා විය හැකි ජනගහනය ලෙස හඳුනාගත් ආකාරයත්, ලඟා විය හැකි ජනගහනයෙන් නියැදිය තෝරාගත් ආකාරයත් විස්තරාත්මක ව ඉදිරිපත් කර ඇත. අධ්‍යයනයේ ලඟා විය හැකි ජනගහනයෙන් පාසල් වර්ගය අනුව, ගුරුවරයාගේ ස්ත්‍රී පුරුෂභාවය අනුව හා උගන්වනු ලබන විෂයය අනුව ස්ථරගත අහඹු නියැදීම් ක්‍රමය මත 140 ක ගුරු නියැදියක් තෝරාගත් ආකාරය පැහැදිලි කර ඇත. එම ගුරුවරු 140 ක නියැදියෙන් දත්ත රැස්කිරීම සඳහා ගුරු ප්‍රශ්නාවලිය ද, ඉන් ගුරුවරු 70 දෙනෙකුගේ ඉගැන්වීම් නිරීක්ෂණය කිරීම සඳහා පන්තිකාමර නිරීක්ෂණ නියමාවලිය ද, ගුරුවරු 21 දෙනෙකු සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමට ගුරු සම්මුඛ සාකච්ඡා නියමාවලිය ද යන දත්ත රැස්කිරීමේ උපකරණ ත්‍රිත්ත්වය භාවිත කරන ලදී.

හතරවන පරිච්ඡේදයෙන් පර්යේෂණයේ එක් එක් අරමුණ හා සම්බන්ධ ව ගොඩනඟා ගත් තේමා ඔස්සේ දත්ත විශ්ලේෂණය කර ඇත. මෙහි දී විස්තරාත්මක අර්ථකතන, ප්‍රතිශත වගු හා කයි වර්ග පරීක්ෂණ යන විශ්ලේෂණ ක්‍රම භාවිත කර ඇත. දත්ත විශ්ලේෂණය තුළින් පර්යේෂණ අනාවරණ ඉදිරිපත් කර ඇති අතර, එම අනාවරණ පදනම් කරගෙන පර්යේෂණයේ නිගමන හා යෝජනා ඉදිරිපත් කිරීම පස්වන පරිච්ඡේදයේ දී සිදු කර ඇත.

ගුරුවරු පන්තිකාමරය තුළ දී සිසුන් තක්සේරුකරණය කිරීම සඳහා වාචික හා ලිඛිත ප්‍රශ්න ඉදිරිපත් කිරීම කරන බවත්, සැලකිය යුතු ගුරු පිරිසක් පන්තිකාමරය තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී තක්සේරුකරණයක නො යෙදෙන බවත්, තක්සේරුකරණයේ යෙදෙන ගුරුවරු පවා ඔවුන්ගේ ඉගැන්වීම් කාලයෙන් $\frac{1}{8}$ ක් එනම්, මිනිත්තු 05 ක පමණ කාලයක් පමණක් තක්සේරුකරණයේ යෙදෙන බවත්, පාසල් වර්ගය අනුව ගුරුවරු භාවිත කරන තක්සේරුකරණ ක්‍රම වෙනස් නො වන බවත්, ගුරුවරයාගේ ස්ත්‍රී පුරුෂභාවය අනුව හා උගන්වනු ලබන විෂයය අනුව භාවිත කරන තක්සේරුකරණ ක්‍රම වෙනස් වන බවත් නිගමනය කෙරේ. තව ද, පන්තිකාමරය තුළ කරනු ලබන තක්සේරුකරණය මඟින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සංවර්ධනයට අවශ්‍ය තොරතුරු රැස්කිරීම ඉතා ම දුර්වල මට්ටමක පවතින බවත්, කිසිදු තොරතුරක් රැස් නො කරන ගුරු පිරිස 64% ක් බවත්, තොරතුරු රැස් කරන සුළු ගුරු පිරිස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සංවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රයෝජනවත් තොරතුරු රැස් කරන අතර, ඒ මත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සංවර්ධනයට ඵලදායී ක්‍රියාමාර්ග ගන්නා බවත් නිගමනය කෙරේ. එසේ ම, තක්සේරුකරණයේ යෙදෙන ගුරුවරු පවා ඉතා ම සාම්ප්‍රදායික මට්ටමේ තක්සේරුකරණ ක්‍රම පන්තිකාමරය තුළ භාවිත කරන බවත් නිගමනය කෙරේ. තව ද, ඉගෙනුම් ක්‍රියාවලිය ආරම්භයේ දී, අතරතුර දී හා අවසානයේ දී තක්සේරුකරණයේ යෙදීම හා තොරතුරු රැස් කිරීම ප්‍රතිලෝම ව සිදු වන බව ද නිගමනය කෙරේ.

සියලු ම සේවාස්ථ හා සේවා පූර්ව ගුරු පුහුණු වැඩ සටහන්වල දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද හා සමාන ව ම තක්සේරුකරණ ක්‍රම පිළිබඳ ව ද අවධාරණය කෙරෙන, ගුරුවරුන්ට තක්සේරුකරණය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා දෙන පුහුණු වැඩසටහන් සෑම ගුරුවරයෙකු වෙනුවෙන් ම සංවිධානය කළ යුතු බවත්, සෑම විට ම පන්තිකාමරය තුළ ගුරුවරයා හා ශිෂ්‍යයා අතර සිදු වන සාකච්ඡා ශිෂ්‍යයා සිතීමට යොමු කරවන, ඉගෙන ගත් කරුණු නැවත ආවර්ජනයට යොමු කරවන, ශිෂ්‍යයාට ඇති වන අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථා සම්පාදනය කෙරෙන ඒවා විය යුතු බවත්, ලිඛිත මෙන් ම ලිඛිත නො වන තක්සේරුකරණ ක්‍රම ද සමාන ව පන්තිකාමරය තුළ භාවිත කළ යුතු බවත්, වර්තමානයේ ක්‍රියාත්මක වන පාසල පදනම් කරගත් ඇගැයීම් (තක්සේරුකරණ) වැඩපිළිවෙල (SBA) වෙනුවට පන්තිකාමර මට්ටමේ තක්සේරුකරණය (CLAss) හඳුන්වා දිය යුතු බවත් යෝජනා කෙරේ.